JSS 2024 2(1) : 127-139

Journal of Social Sciences (JSS)
Volume 02 – Issue 01

# පුරාතන ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු කෙරෙහි කාන්තාවගේ සහභාගීත්වය

**Wijerathna S.W.S.G.**[1]

[1]Department of History, Faculty of Arts, University of Peradeniya, Sri Lanka

## ABSTRACT

*When examining the ancient Sri Lankan society, a number of factors can be identified from literary and archeological sources that women held an important position in politically, socially, religiously and culturally, as well as economically. As the problem of this research, what was the role of women in Sri Lanka's economic affairs in the past? can be introduced. The purpose of this research is to briefly examine the status of women in the society of Sri Lanka in the past, to examine the form of women's participation in economic affairs, and to inquire whether women were given the same important status as men in economic affairs. The non-field method was used this research and according to the qualitative research method, the library research method was used to collect data by using primary and secondary sources, analyze the data and draw conclusions. Women's participation can be recognized in many cases related to the economic affairs of Ancient Sri Lanka and during paddy cultivation, including providing food to the paddy field, tending the paddy field, cutting the stubble, drying and threshing the paddy, growing vegetables and fruits, trading activities, the sugarcane industry, animal husbandry, the pottery industry and the cotton industry. Activities such as cloth weaving, Supa Shastra, and weaving garlands. It is found that other professions such as working as deacons, teaching professions, government service, nursing mothers, escorts, and slave labor were also performed. Because of this, it is clear that in the economic affairs of Sri Lanka in the past, women had a very important status like men and that she was directly and indirectly involved in the economic affairs. It is also clear that the contribution received from women in the economic field had a direct impact on the development of economic activities.*

**KEYWORDS:** Ancient Sri Lanka, Society, Economic affairs, Women's Subscription, Jobs

**සංක්ෂේපය**

පුරාතන ශ්‍රී ලාංකේය සමාජය පිළිබඳ විමසා බලන විට දේශපාලනල සමාජල ආගමික හා සංස්කෘතික මෙන්ම ආර්ථීක වශයෙන් ද කාන්තාව වැදගත් තත්ත්වයක් දරනු ලැබූ බවට සාධක ගණනාවක් සාහිත්‍යමය මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඇසුරින් හඳුනාගත හැකි වේ. මෙම පර්යේෂණයේ ගැටලුව ලෙස අතීත ශ්‍රී ලංකාවේ ආර්ථීක කටයුතුවලදී කාන්තාවගේ කාර්යභාරය කෙබඳු වූයේ දැ? යන්න හඳුන්වාදිය හැකිය. මෙම පර්යේෂණයේදී අතීත ශ්‍රී ලංකාවේ සමාජය තුළ කාන්තාවට හිමි වූ තත්ත්වය පිළිබඳ කෙටියෙන් විමසා බැලීම දල ආර්ථීක කටයුතුවලදී කාන්තා සහභාගීත්වය කෙබඳු ස්වරූපයක් ගත්තේ ද යන්න පිළිබඳ සියුම් ව විමසා බැලීම දල ආර්ථීක කටයුතුවලදී පුරුෂයාට මෙන් වැදගත් තත්ත්වයක් කාන්තාවට ද හිමි වූයේ ද යන්න පිළිබඳ විමසා බැලීම ද අරමුණු වෙයි. මෙහිදී ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය භාවිතා කරන ලද අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුගතව පුස්තකාල පර්යේෂණ ක්‍රමවේදය මගින් ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර පරිශීලනය කරමින් දත්ත රැස්කරල එම දත්ත විශ්ලේෂණය සිදුකර නිගමනවලට එළඹීමේ ප්‍රවේශය භාවිතා කරන ලදී. පුරාතන ශ්‍රී ලංකා සමාජය විමසන විට කාන්තාව ගෞරවනීය තත්ත්වයක සිටි බවට සාධක ගණනාවක් හමු වේ. එමෙන්ම අතීත ශ්‍රී ලංකාවේ ආර්ථීක කටයුතු හා සම්බන්ධ අවස්ථා ගණනාවක දී ම කාන්තා සහභාගීත්වය පැහැදිලිව හඳුනාගත හැකිවේ. වී වගාවේදී කුඹුරට ආහාර සැපයීමල කුඹුරු රැකීමල ගොයම් කැපීමල වී වේළීම සහ කෙටීම වැනි කටයුතු කෙරෙහි සම්බන්ධ වූ අතර එළවලූ හා පළතුරු වගාවට සම්බන්ධ වීමල වෙළඳ කටයුතුවලට සම්බන්ධ වීමල සත්ත්ව පාලනය සිදු කිරීමල උක්හකුරු කර්මාන්තයල කුඹල් කර්මාන්තයල කපු කර්මාන්තයල රෙදි ඇපිල්ලීමල සූප ශාස්ත්‍රය වැනි කටයුතුවල නිරත වීම මෙන්ම මල්මාලා ගෙතීමල පරිවාර සේවිකාවන්ල දාස මෙහෙය වැනි වෙනත් වෘත්තීන් ද සිදුකළ බවට තොරතුරු ගණනාවක් හමු වේ. මේ නිසා අතීත ශ්‍රී ලංකාවේ ආර්ථීක කටයුතුවලදී පුරුෂයාට මෙන් කාන්තාවට ද ඉතා වැදගත් තත්ත්වයක් හිමිව ඇති බව ද ඇය සෘජුව මෙන්ම වක්‍රව ආර්ථීක කටයුතු කෙරෙහි සම්බන්ධ වී ඇති බව ද පැහැදිලි වේ. කාන්තාවගෙන් ආර්ථීකමය ක්ෂේත්‍රයට ලැබුණු දායකත්වය ආර්ථීකමය කටයුතුවල දියුණුව කෙරෙහි සෘජුව බලපාන ලද බව ද පැහැදිලි වේ.

***මුඛ්‍ය පද* -** පුරාතන ශ්‍රී ලංකාව, සමාජය, ආර්ථීක කටයුතු, කාන්තා සහභාගීත්වය, වෘත්තීන්

## 01. හැඳින්වීම

පුරාතන සභ්‍යත්වයික සමාජයන් පිළිබඳ විමසන විට පුරුෂයන්ට මෙන්ම කාන්තාවන්ට ඉතා වැදගත් තත්ත්වයක් හිමි වූ බව තහවුරු වන සාධක ගණනාවක් හමු වේ. ලොව පැරණිම සභ්‍යත්වයන් අතර වැදගත් අවස්ථාවක් වන හරප්පා සභ්‍යත්වය දෙස අවධානය යොමුකරන විට කාන්තාවන්ට වැදගත් තත්ත්වයක් හිමි වූ වා පමණක් නොව සශ්‍රීකත්වය වැනි සාධක මත පදනම්ව මව් දෙවඟන හෙවත් ජගන්මාතාව වන්දනාමාන කිරීම පැවති බවත් එය හරප්පා සභ්‍යත්වයේ ප්‍රධානතම වන්දනාවක් වූ බවත් ඉස්මතුවන ටෙරාකොටා සාධක විශාල ප්‍රමාණයක් හමු වී තිබේ. අතීත ශ්‍රී ලාංකේය සමාජය පිළිබඳව සාහිත්‍යමය මෙන්ම පුරාවිද්‍යාත්මක සාධක ඔස්සේ විමසන විට දේශපාලන, සමාජ, ආර්ථීක, ආගමික හා සංස්කෘතික යන සෑම ක්ෂේත්‍රයකදී

ම පාගේ වැදගත් තත්ත්වයක් කාන්තාවන්ට හිමි වී ඇති බව හඳුනාගත හැකි අතර සමාජය විකාශනය වීමේදී පුරුෂයන් මෙන්ම කාන්තාවන් ද වැදගත් කාර්යභාරයක් ඉටුකළ බවත් පවුලේ වැදගත් තත්ත්වයක් ඇයට හිමි වූ බවත් පෙනේ. කෘෂිකර්මය ප්‍රධාන කොටගත් ආර්ථිකයක් පැවති පුරාතන ශ්‍රී ලංකාවේ වෙළඳාම හා විවිධ කර්මාන්තයන් ද පැවති අතර මෙකී අංශයන්හි දී කාන්තාවගේ සහභාගීත්වය කෙබඳු වූයේ ද යන්න පිළිබඳවත් ඒ තුළින් ආර්ථික කටයුතු කෙරෙහි ලැබුණු දායකත්වය කෙබඳු වූයේ ද යන්න පිළිබඳවත් සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ගෙන් හෙළිවන තොරතුරු ආශ්‍රයෙන් විමසීමට මෙහිදී අවධානය යොමු කෙරේ.

## 02. ක්‍රමවේදය

මෙම පර්යේෂණයේදී ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය භාවිතා කරන ලදී. එහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුගතව යමින් පළමුව පුස්තකාල පර්යේෂණ ඔස්සේ ප්‍රාථමික මූලාශ්‍ර පරිශීලනය කරමින් දත්ත රැස් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීමත් ද්විතියික මූලාශ්‍ර පරිශීලනය කරමින් දත්ත රැස් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීමත් අනතුරුව ක්‍රමානුකූලව පෙළගැස්වීම සිදු කළ අතර පසුව නිගමනවලට එළඹීම සිදු කරන ලදී.

## 03. සාකච්ඡාව

### පුරාතන ශ්‍රී ලාංකේය කාන්තාව

පුරාතන ලක්දිව කාන්තාව විවිධ අංශයන්හි වැදගත් තත්ත්වයක් දරනු ලැබූ බවට සාධක ගණනාවක් හමු වේ. මෙහිදී සමාජය තුළ උසස් තත්ත්වයක් සහිත ප්‍රභූ කාන්තාවන් වාසය කළ බව පෙනේ. විශේෂයෙන්ම ප්‍රභූවරුන්ගේ බිරින්දෑවරුන් මෙන්ම දියණියන් මෙලෙස වැදගත් තත්ත්වයක් උසුලා තිබෙන බවට වංසකතා ප්‍රමුඛ සාහිත්‍ය මූලාශ්‍ර මෙන්ම ශිලා ලේඛන ප්‍රමුඛ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර විමසීමේදී පැහැදිලි වේ. එමෙන්ම සමාජය තුළ කාන්තාවන් පිළිබඳ යහපත් ආකල්ප පැවති බව හඳුනාගත හැකි අතර ගෘහස්ථ ජීවිතය තුළ පවා ඇයට වැදගත් තත්ත්වයක් හිමි වූ ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් වේ. දේශපාලන කටයුතු කෙරෙහි කාන්තා සහභාගීත්වය විමසන විට රාජ්‍යත්වය හා රාජ්‍ය වර්ධනය වීම ආරම්භ වන අවධියේ සිටම විවිධ බලතල දැරීම, රාජ්‍යත්වය හා රාජ්‍ය වර්ධනය වීමෙන් පසු බොහෝ දේශපාලන කටයුතුවලට සම්බන්ධ වීම, විවිධ අංශයන්හි දේශපාලන කටයුතුවලට කාන්තාව අත්‍යවශ්‍ය කෙනෙකු වීම, දේශපාලනයේ වැදගත් තනතුරු කාන්තාවන් ද දැරීම, විවිධ විරුදයන් භාවිතා කිරීම, දේශපාලනයේ උච්චතම අවස්ථාව වන රාජ්‍යත්වයට පවා කාන්තාව පත්වීම, රජුණ්ට උපදෙස් දීම, රජුණ් මෙහෙයවීම මගින් රජුණ්ටත් ඉහළින් සිටීම, ඇතැම් විට පුරුෂයන් අභිබවා තමාට අවශ්‍ය ලෙස කාන්තාවන් ක්‍රියාත්මක වීම වැනි අවස්ථාවන් රාශියක් හඳුනාගත හැකි වේ. ආගමික අංශය විමසන විට බෞද්ධ භික්ෂුණීන්, උපාසිකාවන් වාසය කර ඇති බව හඳුනාගත හැකි අතර වෙහෙර විහාරයන් වෙනුවෙන් පරිත්‍යාග කළ කාන්තාවන් පිළිබඳව ද ඊට අතිරේකව පත්තිනි, ලක්ෂ්මී, සරස්වතී වැනි දේවතාවියන් ඇදහීම ද පැවති බව පෙනේ. සංස්කෘතිකමය වශයෙන් විමසන විට සිතුවම්, මූර්ති, කැටයම් ආදියෙහි කාන්තා නිරූපණයන් විශාල ප්‍රමාණයක් පවතින බවට නිදසුන් හමුවන අතර ඒවායෙහිදී කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම්, ආභරණ, රූපලාවන්‍ය

කටයුතු වැනි බොහෝ තොරතුරු ප්‍රමාණයක් හෙළිදරව් වේ. මේ අනුව පැරණි අවධියේ මෙරට කාන්තාවට සෑම අංශයකින්ම පාහේ වැදගත් තත්ත්වයක් පැවති බව පැහැදිලි වේ.

**ආර්ථික කටයුතුවලදී කාන්තා සහභාගීත්වය**

ඕනෑම සමාජයක ආර්ථිකය පිළිබඳව විමසන විට ප්‍රධාන අවස්ථා කීපයක් හඳුනාගත හැකි වේ. සමාජයේ ප්‍රධාන ජීවනෝපාය මත පදනම්ව ආර්ථිකය සකස් වන අතර ඒ හා සම්බන්ධ අනෙක් ක්ෂේත්‍රයන් ද වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. අතීත සමජයන් විමසන විට ප්‍රධාන වශයෙන්ම කෘෂිකර්මාන්තය, වෙළඳාම, කර්මාන්ත හා සත්ත්ව පාලනය ක්‍රියාත්මක වූ බව හඳුනාගත හැකි අතර ශ්‍රී ලංකාව දෙස අවධානය යොමුකරන විට ද මෙකී තත්ත්වය පැහැදිලිව හඳුනාගත හැකිය. ක්‍රමයෙන් ජනාවාස ව්‍යාප්ත වීමේදී බොහෝ විට ගංගා වැනි ජල පහසුකම් සහිත ස්ථාන ආශ්‍රය කරගෙන එය සිදු වන්නේ කෘෂි අවශ්‍යතා පදනම් කරගෙනය. ප්‍රාග් ඓතිහාසික යුගවල සිටම පුරුෂයන් දඩයමෙහි නිරත වෙමින් ආහාර රැස් කරන විට කාන්තාවන් වනයෙහි ඵල, වැල් ආදී ආහාරයට ගත හැකි දෑ රැස් කරමින් ජීවනෝපාය සරු කරගැනීමට කටයුතු කළ බව පෙනේ. එනම් අතීතයේ සිටම ජීවිකාව සරි කරගැනීම කෙරෙහි කාන්තා දායකත්වය ලැබී ඇති බවයි.

ඓතිහාසික අවධිය විමසන විට සාහිත්‍යමය මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඇසුරින් ආර්ථික කටයුතු කෙරෙහි කාන්තා සහභාගීත්වය කෙබඳු වූයේ ද යන්න තොරතුරු සමුදායක් ඉදිරිපත් වන බව පැහැදිලිය. මෙහිදී සමාජයේ ඉහළ පන්තිවල කාන්තාවන් මෙන්ම සාමාන්‍ය කාන්තාවන් ආර්ථික කටයුතු කෙරෙහි සම්බන්ධ වූ ආකාරය මැනවින් හෙළිදරව් වේ. පැරණි ලක්දිව පැවති අර්ථ ක්‍රමය අනුව කාන්තාව ආදායම් ඉපයීමේ කාර්යයේදී සම වශයෙන් හෝ ද්විතීය වශයෙන් හෝ ඒ වෙනුවෙන් සිය ශ්‍රමය මෙහෙය විය. පුරුෂයන් කැත්ත, උදැල්ල සහ පොරොව සම්බන්ධ කටයුතුවල නිරත වූ අතර කාන්තාව මොහොල, කුල්ල සහ ඉදල වැනි මෙවලම් හැසිරවීමෙහි වඩාත් හුරු වූවාය. (මුණසිංහ, 1998, 73 පි.)

අතීත කාන්තාවන් ගොවිතැන් කිරීමේදී සහාය වීම, ධාන්‍ය වර්ග ප්‍රවාහනය සහ ගබඩා කරගැනීම, එම ධාන්‍ය වර්ග ඇසුරින් විවිධ ආහාර සකස් කරගැනීම සහ එසේ සකස් කරගත් ආහාර ද්‍රව්‍යවලින් කෑම පිස ගැනීම ප්‍රධාන වශයෙන් සිදු කරන ලදී. කෘෂිකර්මාන්තය ආශ්‍රිත ප්‍රධාන කාර්යන්හිදී කාන්තා සහභාගීත්වය නොඅඩුව ලැබී තිබේ. පුරාතන ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ශ්‍රමය පිළිබඳ සාකච්ඡා කරන ඉන්ද්‍රකීර්ති සිරිවීර මහතා පෙන්වා දෙන්නේ නිවසක ස්වාමියා, බිරිඳ හා වැඩකළ හැකි වයසේ සිටි සියලු අවිවාහක දරුවන් මෙම ශ්‍රම ඒකකයට අයත් වූ බවයි (සිරිවීර, 2005, 123 පි.). වී වගාව හා සම්බන්ධ කටයුතුවලදී කාන්තා දායකත්වය නොඅඩුව හිමි වූ බව නිතර දක්නට ලැබේ. කුඩා දරුවන් සිටින මව්වරුන් පවා දරුවන් රැගෙන කුඹුරට හෝ හේනට ගොස් ස්වාමිපුරුෂයන්ට සහාය වෙමින් විවිධ කර්මාන්තයන්හි නිරත වූ බව සනාථ කෙරෙන කථා පුවත් හමු වේ. සද්ධර්මාලංකාරයේ නන්දිමිත්‍ර වස්තුවේ දැක්වෙන ආකාරයට "එක් දවසෙක ඔහුගේ දෙමවුපියෝ කර්මාන්ත භූමියට යන්නාහු ඔහු රඳවාගත නොහී කැටිව ම වඩාගෙන ගොස් උණ පඳුරක් අප සෙවන ඉන්ට සලස්වා මෙහෙවරට පටන්ගත්හ. ඒ තෙම එතෙන නොහිඳ අඩාගෙන ගොස් මෙහෙවර කරන්නවුන්ගේ කකුල් අතුරට වැද මතැත් පැටවකු මෙන් ඇත මැත පෙරළී අතින් පයින් ගසා මෙහෙවර කළ නොදෙයි. එකල ඔහු ගෙන ගොස් වරමන්දකින් ඉහ බැඳ

එක් උණ පඳුරෙක බැඳ ඉන්ද වූහත එකල්හි ද දෙමවුපියන් යන්නා දැක අඩ අඬා තදයේ වේගවත් ව අදිමින් වරමන් ද පුපුරුවා උණ පඳුර මුලින් උදුරා ඇරගෙන ගියේය" (සද්ධර්මාලංකාරය, 1954, 504-505 පි.).

වප් මංගල්‍යය හෙවත් වී වැපිරීමේ උත්සවයට ස්ත්‍රී - පුරුෂ සියලු දෙනාම සහභාගී වූ බවට සාධක හමුවේ. සද්ධර්මාලංකාරයේ දුබ්බිට්ඨිමහාතිස්ස වස්තුවේ සඳහන් වන ආකාරයට "මැත භාගයෙහි උන්ගේ මහත් වූ වප් මඟුලෙක් විය. නොයෙක් සිය ගණන් මනුෂ්‍යයෝ කර්මාන්තයෙහි නියුක්ත වූවාහු. සර්වාංගයෙන් ධවල වූ සුදුගොනුන් කසා නාවා කර බොලු ආභරණ පළඳවා අංවලට රන් රිදී කුප්පි බහා, පය රන් රසු බැඳල සර්වාලංකාරයෙන් සරහා නඟුල් වියදඬු ආදියෙහි යොදා සියලු මනුෂ්‍යයෝ තම තමන්ගේ විභවානුරූප පරිද්දෙන් නොයෙක් කන බොන දෑ සපයා කමින් බොමින් සර්වාභරණයෙන් සැරහී සමහරෙක් සාති. සමහරෙක් වපුරති. ගෙවල ස්ත්‍රී ජනයෝ ද එපරිද්දෙන් ම වස්ත්‍රාභරණාලංකාරයෙන් සැරහී මහත් වූ උත්සවයෙන් වපුරති" (සද්ධර්මාලංකාරය, 1954, 707 පි.). එමෙන්ම සීහළවත්ථුප්පකරණයේ දුට්ඨගාමණී රඤ්ඤො වත්ථුවේ දිරාගිය වස්ත්‍රයක් ඇඳගත් එක් දුගී ස්ත්‍රියක් කොංගු ධාන්‍ය පිර වූ ලබු කැටයක් ගෙන වැපිරීම සඳහා කෙතට ගිය ආකාරය පිළිබඳ සඳහන් වේ. (ඉතා පැරණි සිංහල බණකතා, 1959, 100-101 පි.) "තත්ථෙකා දුග්ගතා ඉත්ථී පොන්තිනන්ත නිවාසිනී කංගුනං ලාබු පූරෙත්වා ඛෙත්තං ගච්ඡති වාපිතුං" (සීහළවත්ථුප්පකරණං, 1959, 20 ගාථාව, 112 පි.).


වී වැපිරීමෙන් අනතුරුව ගොයම් පැළ වූ පසු එම පැළ වැඩිපුර ඇති ස්ථානවලින් ගලවා පාළු තැන්වල සිටුවීම සඳහා ද විශේෂයෙන් ම කාන්තාව සහභාගී වූ බව දක්නට ලැබේ. මේ අතරතුරේදී ගොයම් පැළවලට බාධා වන වල් පැළෑටි ගැලවීම ද ඇය අතින්ම සිදු වූ බව නිසැකය. කෙත් රැකීමේ කටයුත්ත සඳහා ද කාන්තාව සහභාගී විය. පූජාවලියේ එක් තැනෙක දැක්වෙන ආකාරයට කාන්තාව කුඹුරුයායක ඒ මේ අත දුව පනිමින් හඬ නඟා කෑ ගසමින් කුරුල්ලන් පලවා හැර තිබේ. "පැසෙන මස මුළුල්ලෙහි බස බරළ වන තුරු හඬග හඬගා කුඹුරෙහි ඒ මුල්ලෙන් ඒ මුල්ලට දිව දිව කම් සේ නැතිව කුරුලු-කොබෝ-ගිරා ආදී වූ වී කන සතුන් බිණුව මැනැව" (පූජාවලිය, 1951, 376 පි.). ගීත, සින්දු ආදිය ගායනා කරමින් තෘප්තිමත් ආකාරයෙන් කාන්තාව එම කාර්යයෙහි නිරත වූ බව සද්ධර්මාලංකාරයේ පද්මාවතී වස්තුවේ තොරතුරු හමු වේ. "එකල ඒ සිටාණෝ බොහෝ ඇල්කෙත් වපුරුවා ගොයම් පිදී පැසෙන අවස්ථාවෙහි ඒ තමන්ගේ දාස කුමාරිකාව කැඳවාගෙන ගොයම් රකින්නට යැවූහ. ඒ කුමාරිකාවෝ කෙතට ගොස් කුරුළු කොබෝ ආදී වූ සතා සතුන් බැණ ඇල් කෙත අස දඩපැලෙක උන්නාහු කරල් ගණනක් කඩාගෙන ගිනි දල්වා පන්සියයක් විලඳ බැද තබා විලට ගොස් වුන ශුඩ කොට නෙළුම් මලක් දැක කඩාගෙන නැවත අවුත් දඩපැලට නැඟී ගී කිය කියා උන්හ" (සද්ධර්මාලංකාරය, 1954, 167-168 පි.).

ඇල් ගෙවිලියන් පිළිබඳ සිදු කරන වර්ණනා සන්දේශ කාව්‍යවල සඳහන් ව තිබෙන ආකාරය හඳුනාගත හැකිය. ටකපෝරු සොලවමින් කුරුල්ලන් පලවා හැරි ඇල් ගෙවිලියන් පිළිබඳ පරෙවි සන්දේශයේ සඳහන් වන්නේ,

නොසරුප්පා කරනුව එන කුරුලු කැ  ලා
නොසතප්පා සොලවන ටකපෝරු වැ ලා
කසරුප්පා වෙලැ කිරිවන් ගොයම් බ  ලා
නොසතප්පා යව ඇල් ගෙවිලියන් බ  ලා
(පරෙවි සන්දේශය, 111 කවිය)

වශයෙනි. කුඹුරට, හේනට ආහාරය සකස් කරගෙන යාම පැවරුණේ කාන්තාවට බව පෙනේ. උදෑසන ආහාරය ඇඹුල වශයෙන් හැඳින්වූ අතර රාජ කුමාරිකාවන් පවා මෙවැනි කටයුතුවලට සම්බන්ධ වීම පිළිබඳ තොරතුරු හමු වේ. මහාවංසයේ දැක්වෙන ආකාරයට පණ්ඩුකාභය කුමරුට පාලි කුමරිය මුණ ගැසෙන්නේ ඇය තම පියා වූ ගිරිකණ්ඩශිව කුඹුරේ වැඩ කරමින් සිටින විට ආහාර රැගෙන යන අවස්ථාවේ දීය. "පණ්ඩුකාභය කුමරහු මයිල් ගිරිකඬසිව නම් කුමර පඬුවස්දෙව් රජ විසින් දෙන ලද ඒ දේශය අනුභව කෙරෙයි. ඒ ක්ෂත්‍රිය තෙමේ එ කල්හි සියක් කිරියක පැසුණු ගොයම් කප්වයි. උහුගේ දියණිය වූ රුවත් වූ පාලි නම් ක්ෂත්‍රිය කුමරියක් වූවා ඕ තොමෝ හොබනා යානාවකට නැගී පියාණන්ට හා ගොයම් කපන්නට බත් ගෙන්නා ගෙණ සම පිරිවරින් යන්නීය" (මහාවංසය, පරි. 10, 29-32 ගාථා).

තවද මහාවංසයේ දැක්වෙන ආකාරයට සුභ රජුගේ දියණිය උළු වඩුවෙකු වූ තමා ඇති දැඩි කරගත් පියාණන් සේවය කරමින් සිටි කර්මාන්ත ස්ථානයට බත් ගෙනගොස් තිබේ. "ඒ ශුභ රජ ජීවත් වන්නේම වසභයාගේ භය ශංකා ඇත්තේ තමා එක් දුව උළුවඩුවාට භාර කෙළේය. තමගේ කම්බලය ද රාජ භාණ්ඩ ද සලකුණු පිණිස දුන්නේ ය. වසභයා විසින් ඔහු මැරූ කල උළු වඩු තෙමේ ඇය භාරගෙන දූ තනතුරෙහි තබා තමා ගෙයි වඩයි. ඒ ළදරි තොම කම් කරණ ඔහුට බත් එලවිය. නුවණැති ඕ තොමෝ හිඟුරු වැල් ලැහැබෙත නිරෝධ සමාපත්තියට සම වන් (තෙර කෙනෙක්) සක් වෙනි දවස දැක බත් දන් දුන්නේය. නැවත බත් සපයා පියාට බත් එලවීය. පමා වූ කරුණු විචාරණ ලද්දී එපවත් පියහට කීවාය. මේ වඩු තෙමේ තුටු වූයේ නැවත නැවතත් තෙරුන්ට බත් දෙවීය" (මහාවංසය, පරි. 35, 101-107 ගාථා). වංසත්ථප්පකාසිනියේ මෙම තොරතුර වඩාත් සවිස්තරව දක්වා තිබේ (වංසත්ථප්පකාසිනී, 1994, 528 පි.).



**කාන්තාවන් ගොයම් කපන අවස්ථාවක් දැක්වෙන කල්පිත සිතුවමක්**

ගොයම් කැපීමෙන් පසුව බොල් වී පෙළීම සහ පිදුරු සැලීම කාන්තාවන්ට පැවරිණි. නිවසට ගෙන එන ලද වී ආදිය වේළා ගබඩා කර ගැනීම කාන්තාව සිදුකළ අතර මහලු කාන්තාවන් පවා වී අව්වෙහි දමා වේළීම සිදුකළ බව මහාවංසයේ තොරතුරු හමුවේ. "එකා මහල්ලිකා විහිං සොසෙතුං ආතපෙ බිපි දෙවො අකාලෙ වස්සිත්වා තස්සා වීහිං අතෙමසි" වශයෙන් (ඌනපූරණසහිතො මහාවංසො, පරි. 21, 27 ගාථා) දැක්වෙන්නේ "එක් මැහැල්ලක් තොමෝ වී වේලන්ට අව්වෙහි දැමුවා නොකල් වැස්සෙක් වැස ඒ වී තෙමුයේ යි. ඕ තොමෝ වී ගෙණ ගොස්

ඒ මිණිය පහළා." යනුවෙනි (මහාවංසය, පරි. 21, 27 ගාථාව). වංසත්ථප්පකාසිනිය දක්වන්නේ මැහැල්ල විසින් වියලාගනු පිණිස අව්වෙහි වැනූ වී දිවා කල වැටුණු අකල් වැස්ස විසින් තෙමා තිබෙන බවයි (වංසත්ථප්පකාසිනී, 1994, 334 පි.). වැස්ස අධික කාලවලදී සහ හදිසි අවස්ථාවලදී දුමෙහි දමා වී වේලා ගැනීම සිදු වූ අතර එලෙස අව්වෙන් හෝ ගින්නෙන් හෝ වී වියළාල තම්බාල කොටාල දහයියා සහ කුඩු ඉවත් කොටල සුන් සහල් වෙන් කොට බත පිළියෙළ කරගැනීම ගෘහණිය විසින් ඉටුකළ යුතු ප්‍රධාන සහ වැදගත් කාර්යයන් ලෙස සමාජයේ සෑම යුගයක දී ම සැලකිණ. චන්ද්‍රා නමැති බැල මෙහෙවර කරන එක්තරා කාන්තාවක් දානයක් දීම සඳහා ධනය උපයා ගැනීමේ අරමුණින් එක් වේලක් පමණක් ආහාර ලබාගෙන කුලිය ඉතිරි කරගත් අතර රාත්‍රී කාලයේදී වී කෙටීම, පෙළීම ආදියෙහි නිරතව සිට රාත්‍රියේදී නින්ද නොයාම සඳහා මොහොල් ගස් ගොඩ මත නිදාගත් ආකාරය පිළිබඳ තොරතුරු සීහළවත්ථුප්පකරණයේ සඳහන් වේ (ඉතා පැරණි සිංහල බණකතා, 1959, 131 පි.). වී කෙටීමෙහි නියුක්ත වූ කාන්තාවන් පිළිබඳ තොරතුරු හතරවන මිහිඳු රජුගේ මිහින්තලා ලිපියෙහි ද සඳහන් ව ඇත (Epigraphia Zeylanica Vol. I, p. 88). මේ ආකාරයට විමසන විට රාජ කුමාරිකාවන් කෘෂිකාර්මික කටයුතුවලට සහභාගී වූයේ කලාතුරකින් වුවද කෘෂිකර්මය ප්‍රධාන ජීවනෝපාය වූ ගැමි සමාජයේ කාන්තාව එකී කටයුතු ඉටුකිරීම පිළිබඳ නිදසුන් රාශියක් දක්නට ලැබෙන බව හඳුනාගත හැකිය.




ධාන්‍ය කෙටීම, පෙළීම සිදුකරන කාන්තාවන් දැක්වෙන ඡායාරූපයක්

පුරාතන ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ තවත් වැදගත් අංශයක් වූ වෙළඳාමෙහි කාන්තාවන් නිරත වූ බවට සාධක කීපයක්ම හමුවේ. කෝට්ටේ යුගය වන විට කාන්තාවන් ද පුරුෂයන් මෙන් වෙළෙඳාමෙහි නියුක්ත වූ බව සන්දේශ කාව්‍යවලින් තොරතුරු හෙළි වේ. අධාර්මික වෙළෙඳාමෙන් ලැබෙන විපාක සිහිකොට සාධාරණ ලෙස වෙළෙන්දියන් භාණ්ඩ විකුණන ලද ආකාරය ගිරා සන්දේශය වර්ණනා කර තිබේ.

වටින නොයෙක් බඩු අරගෙන ඇමදා ම
වටින මිලට නොවිකොට කොට වෙළෙඳා ම
සිටින ලියන් දැක සිහිකර බණදා ම
වඩින කෝන්ගස සෙවණේ නොරඳා ම
(ගිරා සන්දේශය, 58 කවිය)

වෙළෙඳසැල්වල මෙන්ම විශාල ගස් යට සෙවණේ තබාගෙන කාන්තාවන් බඩු වෙළඳාම් කළ ආකාරය ද මෙයින් පැහැදිලි වේ. කෝට්ටේ යුගයේ වෙළෙන්දියෝ ද සල්පිල් උඩ හිඳගෙන හඬ නංවා බඩුවල මිල කියමින් වෙළෙඳාම් කළ බවට තිසර සන්දේශය මගින් තොරතුරු හෙළිවේ.

රදනා මනා මහවේ සල් පිළුඹුව ල
නොමැවෙන බොළඳ වෙළෙඳහනන්ගෙ තුඩුව ල
ඇතිසේ නම් කරන කොලහලය බඩුමි ල
රුඳුමට සිතත් ඉන් නොසිතන්න උඩුතෙ ල
(තිසර සන්දේශය, 56 කවිය)

සත්ත්ව පාලන කටයුතු කෙරෙහි කාන්තාව සම්බන්ධ වූ ආකාරය පිළිබඳව ද තොරතුරු රාශියක් මූලාශ්‍ර මගින් හෙළිවේ. සද්ධාර්මාලංකාරයේ තිස්සාවගේ වස්තුව විමසන විට රෝහණ ජනපදයේ වාසය කළ තිස්සා නම් කාන්තාවක් උදේ සවස නොවරදවා එළදෙනුන්ගෙන් කිරි දොවාගත් ආකාරය පිළිබඳ සඳහන් වේ (සද්ධර්මාලංකාරය, 1954, 584-586 පි.) එළදෙනුන්ගෙන් කිරි ලබා ගැනීම ගරු කටයුතු සේවාවක් ලෙස සැලකුණු අතර එබැවින් සාමාන්‍ය සමාජයේ ස්ත්‍රීන් පමණක් නොව ඉහළ පන්ති නියෝජනය කළ කාන්තාවන් පවා එළදෙනුන්ගෙන් කිරි දෙවීම පිළිබඳ දැන සිටි බවට තොරතුරු හමුවේ. සද්ධාතිස්ස රජුගේ මෙහෙසිය කිරි එළදෙනුන් දෙවීමේ දක්ෂ වූ තැනැත්තියක ලෙස සඳහන් වේ (රසවාහිනිය, 1961, 32-34 පි.).


පළතුරු වෙළෙඳාම් සිදුකරන කාන්තාවන් දැක්වෙන ඡායාරූපයක්

සන්දේශ කාව්‍යයන් විමසන විට ගොපලු කාන්තාවන් පිළිබඳ විටින් විට සඳහන් වී තිබීමෙන් පැහැදිලි වන්නේ ගවයන්ගේ කටයුතු ඉටුකළ කාන්තාවන් සමාජයේ සිටි ආකාරයකි. තිසර සන්දේශයේ සඳහන් වන්නේ,

ගෙරි කමින් යනෙන ගොපලු අඟනන්ගේ තුනු තැළී යේ
නෙතු සිතු සනසමින් සබඳ නොසලව මොරටුව එළි යේ
(තිසර සන්දේශය, 89 කවිය)

යනුවෙනි. ගිරා සන්දේශයේ දැක්වෙන ආකාරයට,

බැඳලා ගවන් වෙත ගවපලු ලිය සිටි ය
නොබලා මිතුර යාගත් මහ පොතුපිටිය
(ගිරා සන්දේශය, 73 කවිය)

මෙම අවස්ථා විමසන විට මොරටුව, පොතුපිටිය වැනි ප්‍රදේශවල ද ගවයන් බලා ගැනීමේ කාර්යයෙහි නිරත වූ කාන්තාවන් සිටි බව පැහැදිලි වේ. එමෙන්ම සත්ත්ව පාලනය හා සම්බන්ධව විවිධ ආහාර වර්ගයන් සකස් කිරීම සිදුකළ අතර පස්ගෝ රස භාවිතයෙන් විවිධ ආහාර වර්ග සකස් කිරීම පිළිබඳ තොරතුරු ද හමු වේ.

පුරාතන ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු විමසන විට විවිධ කර්මාන්තයන්ට වැදගත් තත්ත්වයක් හිමිව පැවති බව පැහැදිලිය. මෙකී බොහෝ කර්මාන්තයන්හි නිරත වූ පුරුෂයන්ට කාන්තාවන්ගේ සහාය නිරන්තරයෙන් ලැබුණු බවට සාධක හමු වේ. ගඩොල් කර්මාන්තයේදී කාන්තාවන් ද පුරුෂයන්ට සහාය වෙමින් එම කටයුතුවල යෙදුණු බවට ද සාධක ඇත. කුඹල් කර්මන්තය විමසන විට සද්ධාතිස්ස රාජ්‍ය අවධියේ දී අනුරාධපුරයේ විසූ එක්තරා දුගී ගොවියෙකු තම එකම දුවගේ සහාය ඇති වී ගඩොල් කැපීමේ කර්මාන්තයේ යෙදුණු බව සීහළවත්ථුප්පකරණයේ සඳහන් වන ආකාරය හඳුනාගත හැකිය. "ධීතාව අත්තනො එකා ඉධ කම්මේන ජීවති" ලෙස එහි සඳහන් වේ (සීහළවත්ථුප්පකරණං, 1959, 121 පි.).



කුවේණිය කපු කටිමින් සිටි අවස්ථාව දැක්වෙන කල්පිත සිතුවමක්

මෙරට ආදීතම අවධිවල සිටම කපු කර්මාන්තය පැවති බවට සාධක හමුවන අතර බ්‍රාහ්මී ලිපිවල "පෙහෙකර" වශයෙන් දැක්වෙන්නේ පේෂ කර්මාන්තයේ නියුක්ත වූ අයයි. මෙරට ලිඛිත ඉතිහාසයේ ආරම්භය සනිටුහන් කරන සිදුවීම වන විජය කුමරු මෙරටට ගොඩබැසීමේ පුවතෙහිදී කුවේණිය කපු කටිමින් සිටි බවට තොරතුරු ඉදිරිපත් වේ. "පිරිවර යකින්නක් බැලි රුවින් තමා දැක්විය. උන් අතුරෙන් එකෙක් රජ පිත්හු විසින් නවතනු ලදුයේත් ගම් ඇති කල බල්ලෝ ඇති වන්නාහ යි ඇය පසු පස්සෙහි ගියේය. ඇයගේ ස්වාමී දූ වූ කුවේණි නම්යකිනි තොමෝ කපු කටනා තවුසියක් සෙයින් එහි රුක් මුලෙක හුන්නා ය." වශයෙන් මහාවංසයේ සඳහන් වේ. (මහාවංසයල පරි. 7, 10-12 ගාථා) පූජාවලියේ දැක්වෙන ආකාරයට දෙවන පරාක්‍රමබාහු රජු "කඨින දානයක් දෙමි යි සිතා ලක්දිව බොහෝ ස්ත්‍රී පුරුෂයින් රැස් කරවා කපුයෙහි පටන් ඉවුම - රිකුරුම - පෙදකිරීම - කැටීම - වියවීම - ඇපිළී ම - කඩ කැපීම - ගෙත්තම් කිරීම - රඳනම යනාදී වූ සියලූ කර්මාන්ත ම සුවහස් ගණන් සත්ත්වයන් ලවා එක දාම නිමවා" යනුවෙන් වන සඳහන අනුව දඹදෙණි රාජධානි සමයේ දී කපු කර්මාන්තය ප්‍රචලිතව පැවති බව ද කාන්තාවන් පවා එම කටයුතුවල නිරත වූ බව ද හඳුනාගත හැකිය (පූජාවලිය, 1951, 795 පි.).

හෙරණසිඛවිනිසෙහි දැක්වෙන තොරතුරු අනුව ක්‍රි. ව. දහවන සියවසේ ජීවත් වූ ස්ත්‍රී ජනයාට නූල් කැටීම මනාව පුරුදු පුහුණු කළ කර්මාන්තයක් බව පෙනේ. "ඇතුළු වෙහෙර සිටැ යන්නහු විසින් දොරට සැපැත් කලැ සෙනඟට ඉතා නුදුරුවැ ආසන්න නොවැ ගෙට ඉදිරි වැ සිටැ හු කටිනා මාගමක හූයක් කැටැගෙන පමණ කලක් සිටැ බික නොඅළහොත් ගෙය බලා" (සිඛවළඳ හා සිඛවළඳවිනිස, 1970, 167 පි.) වශයෙන් භික්ෂුවක නිවසකට පිඩු සිඟා ගිය පසු ගෙයි ඉදිරිපස එම භික්ෂුව සිටිය යුත්තේ කාන්තාවක නූලක් සකස් කරන කාලසීමාව තෙක් පමණක් බව මෙහි අර්ථය වේ. ඒ අනුව පුරාතන අවධියේ කාන්තාව නූල් කැටීමෙහි නිරත වූ බව ද එකී කටයුතු කාර්යක්ෂමව සිදු කළ බව ද හඳුනාගත හැකිය. පූජාවලියේ දැක්වෙන්නේ, "ඇතැම් කාන්තාවන් පුළුල් රල් තුනින් තුන බඳා මකුළුහු සේ ඉතා සූක්ෂමව හූ කැටීමට දක්ෂ වූහ" (පූජාවලිය, 1951, 610 පි.) යනුවෙනි.

උක් ඇඹරීම සහ උක්පැණි නිෂ්පාදනය කිරීම සිය නිවසේදී ම කාන්තාව විසින් ඉටු කරගන්නා ලද ආකාරයක් හඳුනාගත හැකිය. සීහළවත්ථුප්පකරණයේ ධම්මික රාජ වත්ථුවේ දැක්වෙන ආකාරයට රජු සහ ඇමතියා රාජ්‍යයේ සමෘද්ධිය පිළිබඳ සොයා බැලීමට යාමේ පුවතක් හමු වේ. "ඕ තොමෝ මොවුන් සියුමැලි ශරීර ඇත්තන් බව දැක දරුවෙනිල පිරිසිදු උක්පැණි හා අනුභව කරනු කැමැත්ත අඩු හුදරැ නැතහොත් දීකිරි සමග හෝ ගිතෙල් සමග අනුභව කරනු කැමැත්තහුදැයි මට කිව මැනවැයි කිය. ඇගේ බස් ඇසූ මේ දෙදෙන ශාන්ත සිතැතිව මෑණියෙනි උක්පැණි සමග දෙවයි කීහ. ඕ තොමෝ යහපතැයි කියා පිරිසිදු භාජනයක් ගෙන උක්වත්තට ගොස් උක්ගසක් කඩා පැණි බේරාගැනීම සඳහා එය අත්වලින් ඇඹරීය" (ඉතා පැරණි සිංහල බණකතා, 1959, 116-117 පි.). රසවාහිනියේ දැක්වෙන ආකාරයට එක් අවධියක ධනවත් මිනිසකු ගේ කුඹුරක වප් මඟුලක් පැවැත්වෙන අතර ඔහුගේ සතුරෙකු විසින් කරන ලද වැරදි ආරාධනයක් අනුව අභයගිරි වෙහෙරින් 500 ක් පමණ භික්ෂූන් වහන්සේලා දන් පිණිස ඒ ධනවත් ගොවියාගේ ගෙදරට වැඩම කරන ලද අතර ගොවි බිරිඳ කිසිම කරදරයක් නැති ව ගිතෙල් පැණි හා සකුරු මිශ්‍ර ආහාරයක් මහ සඟනට පූජා කර තිබේ (රසවාහිනිය, 1961, 166 පි.). මෙකී තොරතුර අනුව පැහැදිලි වන්නේ සුරක්ෂිතව උක්පැණි සකස් කරගෙන තිබූ බවත් කාන්තාව එම කටයුතුවලදී මූලික වන්නට ඇති බවත් ය.

ඇතැම් කාන්තාවන් විශේෂ රැකියාවන්හි නිරත බවට තොරතුරු හමුවේ. මල් සැපයීමේ සහ මල්මාලා ගෙතීමේ රැකියාවන්හි කාන්තාවන් නිරත වූ බව පෙනේ. කල්‍යාණවතී රැජිනගේ රුවන්වැලි සෑ පුවරු ලිපියේ "මඟුල් මිඩියන් මාලාකාරීන් (ඔසන්දවටුවන් ආදීන්ට) ප්‍රසාදයෙන් රනින් සතුටු කර වා" වශයෙන් (Epigraphia Zeylanica Vol. IV, p. 256) සඳහන් වේ. තවද සේවිකාවන් පිළිබඳ තොරතුරු ද ඉදිරිපත් වේ. සද්ධර්මාලංකාරයේ නකුල වස්තුවේ දැක්වෙන ආකාරයට මාගම එක් කුලගෙදරක නකුල උපාසකගේ දූව මෙහෙකාරකම් සිදුකර තිබේ (සද්ධර්මාලංකාරය, 1954, 578 පි.). එහිම තිස්සා වස්තුවේ දැක්වෙන ආකාරයට ණය දුන් අයගේ නිවෙස්වල මෙහෙකාරකම් කළ තිස්සා නම් ගැහැනියක් විය. (සද්ධර්මාලංකාරයල 1954, 584 පි.) එමෙන්ම හතරවන මිහිඳු රජුගේ මිහින්තලා ලිපියෙහි දැක්වෙන ආකාරයට "මිනිදි" නමින් හැඳින් වූ සේවිකාවන් 24 දෙනෙක් විහාරයෙහි වැඩ කටයුතුවල නිරත වූ අතර මොවුන්ගෙන් ප්‍රධාන තැනැත්තිය "මිඩි වැජැරුම" නම් වූවාය. "බත් ගේ ලැදිය" නමින් බත් ගේ භාර කාන්තාවක් ද, "ජෙට්මව" නමින් හැඳින්වූ තැනැත්තියක් සහ "වටිම්ඩි" හෙවත් වී කොටන දාසීන් ද මේ අතර සිටියහ. "සලාජෙටු" සහ "පිසන සලයින්" නමින් හැඳින්වුණු සේවිකාවන් කෑම පිසීමෙහි නිරත විය. මෙකී තනතුරු අනුව පැහැදිලි වන්නේ අනුරාධපුරයේ මහාපාලි දාන ශාලාවේ සේවයේ නියුක්තව සිටි මෙම කාන්තාවන් විවිධ වෘත්තීන් අනුව කටයුතු කළ බවයි. රජුගේ නියමය පරිදි මෙම සේවිකාවන්ට රජයෙන් සහල් සහ කහවණු ලැබී තිබේ (Epigraphia Zeylanica Vol. I, p. 109).

දාසියන් ලෙස සේවයේ නිරත වූවන් පිළිබඳ තොරතුරු ද මූලාශ්‍ර මගින් හෙළිදරව් වේ. මියුගුණු වෙහෙර ගුහා ලිපියේ "උපසිකදිණකදසිකය ලෙනෙ සගස" (Inscription fo Ceylon Vol. I, p. 33) යනුවෙන් කණදාසික නමැති දාසියක පිළිබඳ සඳහන් වන අතර පණ්ඩුකාභය කුමරු ළදරු කාලයේ දී දාසියක විසින් දොරමඬලා නම් ග්‍රාමයට ගෙනයන ලද බවට මහාවංසයේ දැක්වේ (මහාවංසය, පරි 10, 1-6 ගාථා). පොළොන්නරු සහ දඹදෙණි යුගයන්හි ඇතැම් වකවානුවල දී විහාරාරාම සතුව පැවති ගම්බිම් දාස දාසීන් ලවා වගා කරවන ලද බවට සාධක හමුවේ.

කල්‍යාණවතී රැජින සහ ආයස්මන්ත සෙනෙවියා විසින් පන්නල සහ වැලිගම කුලවඩන නම් විහාරයට කෙත්වතු පූජා කරන අවස්ථාවේදී ඒ සමඟ දැසි දස්සෝ ද පවරා දෙන ලදී (මහාවංසය, පරි 80, 35-41 ගාථා).

**සමාලෝචනය**

මේ ආකාරයට විමසන විට පුරාතන ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු හා සම්බන්ධ අවස්ථා ගණනාවක දී ම කාන්තා සහභාගීත්වය පැහැදිලිව හඳුනාගත හැකිවේ. ආර්ථිකයේ ප්‍රධාන අංගයන් වූ කෘෂිකර්මාන්තය, වෙළඳාම, විවිධ කර්මාන්ත හා සත්ත්ව පාලනය වැනි අවස්ථාවලදී කාන්තා සහභාගීත්වය සිදු වූ අයුරු දක්නට ලැබේ. මෙහිදී වී වගාවේදී සී සෑම, කුඹුරට ආහාර සැපයීම, කුඹුරු රැකීම, ගොයම් කැපීම, වී වේළීම සහ කෙටීම වැනි කටයුතු කෙරෙහි සම්බන්ධ වූ අතර එළවලු හා පළතුරු වගාවට සම්බන්ධ වීම, වෙළඳ කටයුතුවලට සම්බන්ධ වීම, සත්ත්ව පාලනය සිදු කිරීම, උක්හකුරු කර්මාන්තය, කුඹල් කර්මාන්තය, කපු කර්මාන්තය, රෙදි ඇපිල්ලීම, සූප ශාස්ත්‍රය වැනි කටයුතුවල නිරත වීම මෙන්ම මල්මාලා ගෙතීම, පරිවාර සේවිකාවන්, දාස මෙහෙය වැනි වෙනත් වෘත්තීන් ද සිදු කළ බවට තොරතුරු ගණනාවක් හමු වේ. මේ අනුව අතීතයේ සිට ආර්ථික කටයුතු කෙරෙහි පුරුෂාධිපත්‍යයක් දෘෂ්‍යමාන වුව ද කාන්තාවන් ද පුරුෂයන්ට දෙවෙනි නොවන ආකාරයෙන් අනෙක් අංශයන්හිදී මෙන් ආර්ථික කටයුතුවලදී ද ක්‍රියාශීලී තැනැත්තියක වූ බව පැහැදිලි වේ. තවද මහාවංසය, දීපවංසය වැනි මහා සම්ප්‍රදාය නියෝජනය කරන බොහෝ මූලාශ්‍රයන් අනුරාධපුර ප්‍රදේශය හා ප්‍රභූ පක්ෂය මූලික කරගෙන රචනා වී තිබෙන නිසා අනුරාධපුරයෙන් දුර බැහැර ප්‍රදේශවල හා සාමාන්‍ය කාන්තාවන්ගේ ආර්ථික කටයුතු පිළිබඳ තොරතුරු හෙළිවන්නේ අල්ප වශයෙන් බවත් සද්ධර්මාලංකාරය, සද්ධර්මරත්නාවලිය, සීහළවත්ථුප්පකරණය, සන්දේශ කාව්‍ය වැනි මූලාශ්‍රවල වස්තු විෂයන් සාමාන්‍ය සමාජය ආශ්‍රය කරගනිමින් රචනා වී තිබීම නිසා සාමාන්‍ය ජනතාව පිළිබඳ තොරතුරු රාශියක් අන්තර්ගත වීමෙන් කාන්තාවන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු සමුදායක් හෙළිවන බව පෙනේ. ඒ අනුව පුරාතන ශ්‍රී ලාංකේය කාන්තාව සෘජුව මෙන්ම වක්‍රව ආර්ථික කටයුතු කෙරෙහි සම්බන්ධ වූ අතර ආර්ථික අංශයේදී ඇයගේ දායකත්වය ඉතාමත් වැදගත් වූ බව ද පැහැදිලි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


ආරියපාල, ඇම්. බී. (1962). **මධ්‍ය කාලීන ලංකා සමාජය**. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඉන්ද්‍රපාල, අයි. කේ. (1965). "සමාජ තොරතුරු", **අනුරාධපුර යුගය**. සංස්. අමරදාස ලියනගමගේ සහ රණවීර ගුණවර්ධන. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**ඉතා පැරණි සිංහල බණකතා (කණ්ටකසෝල පටුනේ විසූ ආචාර්ය ධම්මනන්දි මහතෙරපාණන්ගේ සීහළවත්ථුවේ සිංහල අනුවාදයයි).** (1959) අනු. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ : රත්න පොත් ප්‍රකාශකයෝ.

**ඌනපූරණසහිතො මහාවංසො**. (1959). සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

එල්ලාවල, හේම. (1962). **පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය**. කොළඹ : සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.

**ගිරා සන්දේශය**. (1928). සංස්. ටී. සුගතපාල, ජේ. ඩී. ප්‍රනාන්දු විසින් මුද්‍රිතය, කොළඹ ග්‍රන්ථ ප්‍රකාශන යන්ත්‍රාලය.

තිසර සන්දේශය, (1938). සංස්. සර්. ඩී. බී. ජයතිලකල කොළඹ.

පරණවිතාන, ඇස්. (1972). "පොළොන්නරු යුගයේ සභ්‍යත්වය දේශපාලන, ආර්ථික හා සමාජ තත්ව" **ලංකා විශ්වවිද්‍යාලීය ලංකා ඉතිහාසය, i කාණ්ඩය, ii භාගය**. සංස්. හේමචන්ද්‍ර රාය, කැළණිය : විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

**පරෙවි සන්දේශ විවරණය**. (1958). සංස්. කුමාරතුංග මුනිදාස, අනුල මුද්‍රණාලය.

**පූජාවලිය**. (1951). සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි, කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

**මහාවංසය**. (2018). සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ පඬිතුමන්, දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මුණසිංහ, ඉන්ද්‍රාණි. (1998). **පැරණි ලක්දිව කාන්තාව (ක්‍රි. පූ. සවන සියවසේ සිට ක්‍රි. ව. පහළොස්වන සියවස දක්වා)**. දෙහිවල : කතෘ ප්‍රකාශනයකි.

**රසවාහිනී**, (1961). සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි, කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

**වංසත්ථප්පකාසිනී මහාවංසටීකාව - සිංහල අනුවාදය**. (1994). අනු. අකුරටියේ අමරවංස නාහිමි සහ හේමචන්ද්‍ර දිසානායක, කැළණිය විශ්වවිද්‍යාලය : පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

**සද්ධර්මරත්නාවලිය**. (1985). සංස්. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපාකාර සමාගම, කොළඹ : ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය.

**සිතියම් සහිත සද්ධර්මාලංකාරය**. (1954). සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි, කොළඹ : ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය.

**සිඛවළඳ හා සිඛවළඳවිනිස**. (1970). සංස්. පණ්ඩිත මැදඋයන්ගොඩ විමලකීර්ති හිමි, කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

සිරිවීර, ඉන්ද්‍රකීර්ති. (2005). **ශ්‍රී ලංකාවේ කෘෂි ඉතිහාසය**. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සිරිවීර, ඉන්ද්‍රකීර්ති. (2001). **රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි**. කොළඹ : දයාවංශ ජයකොඩි සහ සමාගම.

**සීහළවත්ථුප්පකරණං**. (1959). අනු. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ : අනුල යන්ත්‍රාලය.

හෙට්ටිආරච්චි, ඇස්. බී. (2008). **ලංකාවේ සමාජ හා සංස්කෘතික ඉතිහාසය ක්‍රි. ව. 300 පමණ සිට ක්‍රි. ව. 1000 පමණ දක්වා**. මහරගම : කතෘ ප්‍රකාශනයකි.

ගයිගර්, විල්හෙල්ම්. (1969). **මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය**. පරි. ඇම්. බී. ආරියපාල, කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

Z. Wickremasinghe, D. M. de. (1912). “The Two Tablets fo Mahinda IV at Mihintale”, **Epigraphia Zeylanica Vol. I**. ed. D. M. de. Z. Wickremasinghe, New Delhi : Asian Educational Services.

Paranavitana, S. (1943). “The Ruwanvalisaya Slab inscription of Queen Kalyanavati” **Epigraphia Zeylanica Vol. IV**, ed. S. Paranavitana, New Delhi : Asian Educational Services.

**Inscription of Ceylon, Vol. I**. (1970). ed. S. Paranavitana, Colombo : Department of Archealogy.